# උත්ථාන සමයේ දෙවන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි. ක්‍රියා 5 : 34-42

**අපෝස්තුළුවරු ජේසුස් ස්වාමින් වහන්සේගේ නාමය උදෙසා නින්දා විඳීමේ භාග්‍යය ගැන ප්‍රීති වූහ.**

එහෙත් විනයධරයෙකු වූ සියල්ලන්ගේ ප්‍රශංසාව ලැබූ ගමාලියෙල් නම් එක් පරිසිවරයෙක් මන්ත්‍රණ සභාවෙහි නැඟිට අපෝස්තුළුවරුන් ටික වේලාවකට පිටතට ගෙන යන්නට අණ කොට මෙසේ කීය. “ඉශ්රායෙල් ජනයිනි, ඔබ මේ මිනිසුන්ට කරන්නට යන දේ ගැන පරිස්සම් වන්න. ටික කලකට පෙර තියුදාස් තමා වැදගත් කෙනෙකැ යි කියමින් ඉදිරිපත් විය. ඔහුට මිනිසුන් හාරසිය දෙනෙක් පමණ එකතු වූහ. එහෙත් ඔහු මරනු ලැබීය. ඔහුගේ අනුගාමිකයෝ සියලු දෙනා විසිර ගොස් නැත්තට ම නැති වූහ. ඔහුට පසු සංගණනය කළ දවස්වල ගලීලයේ ජූදස් ඉදිරිපත් වී ජනයාගෙන් සමහර දෙනෙකු තමා වෙතට දිනා ගත්තේ ය. ඔහු ද විනාශ විය. ඔහුගේ අනුගාමිකයෝ ද විසුරුවනු ලැබූහ. ඉදින් මේ සිද්ධිය ගැන මා ඔබට කියන්නේ මේ මිනිසුන්ගෙන් ඈත් වී සිටින්න කියාත්, තමන්ගේ පාඩුවේ ඉන්නට ඔවුන්ට ඉඩ හරින්න කියාත් ය. ඔවුන්ගේ මේ ව්‍යාපාරය හෝ ක්‍රියා මාර්ගය හෝ මිනිසාගෙන් වන දෙයක් නම් එය කඩාකප්පල් වන්නේය. එහෙත් එය දෙවියන් වහන්සේගෙන් වන දෙයක් නම් ඔවුන් පරාජය කරන්නට ඔබට නොහැකිය. එපමණක් නොව ඔබ අදහස් කරන දේ දෙවියන් වහන්සේට විරුද්ධව සටන් කිරීමක් වීමට ද ඉඩ ඇත.” ඔව්හු මේ අවවාදය පිළිගත්හ.

ඉන්පසු ඔව්හු අපෝස්තුළුවරුන් තමන් වෙතට ගෙන්වා කස පහර දී ජේසුස් වහන්සේගේ නාමයෙන් කතා නොකරන්නට අණ කොට ඔවුන් නිදහස් කර යැවූහ. එවිට අපෝස්තුළුවරු ඒ නාමය උදෙසා නින්දා විඳීමේ භාග්‍යය ගැන ප්‍රීති වෙමින් මන්ත්‍රණ සභාවෙන් ඉවත්ව ගියහ. තවද ඔව්හු දිනපතා ම දේව මාළිගාවේ ද

ගෙදරක් ගෙදරක් පාසා ද ඉගැන්වීමෙහිත් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ සුබ අස්න දේශනා කිරීමෙහිත් නිරත වූහ.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 27: 1,4, 13-14

පිළිතුර: සමිඳුනි ඔබ මන්දිරයේ විසීම මාගේ එකම යැදුම ය. ආලේලූයා //

ගීය:

හිමිසඳ මාගේ ආලෝකය හා විමුක්තිය ය. මම කිසිවෙකුට බිය නොවෙමි. හිමිසඳ මාගේ ජීව ශක්තිය ය. මට භීතියක් නැත.

හිමිතුමන්ගේ එකම යැදුමක් යදිමි. එය නරයේ සොයන්නෙමි. එනම් හිමිතුමන්ගේ ශෝභාලංකාරය නරඹන පිණිසත්, දේව මාලිගාවේ දී උදය භාවනා කරන පිණිසත් මා දිවි ඇතිතාක් හැම දා සමිඳුන්ගේ මන්දිරයේ විසීම ය.

"ජීවතුන් තර සමිඳුන්ගේ යහපත්කම දක්නට ලැබේ ය"යි මම විශ්වාස කරමි. සමිඳුන් කෙරේ විශ්වාසය තබන්න. ශක්තිමත් වන්න. ධෛර්යයවත් වන්න. සමිඳුන් කෙරේ විශ්වාසය තබන්න.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
උත්ථාන කරනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ යළිත් නොමැරන සේක.
මින්මතු මරණය උන්වහන්සේ කෙරෙහි බලපවත්වන්නේ නැත.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 6 : 1–15

**එහි හිඳගත් සැමදෙනාට රුචි තරම් ආහාර ලැබිණි.**

ඉන්පසු ජේසුස් වහන්සේ ගලීල මුහුදෙන් හෙවත් තිබේරියස් මුහුදෙන් එගොඩට වැඩම කළ සේක. උන් වහන්සේ රෝගීන් සුව කරමින් කළ හාස්කම් දුටු බැවින් මහා සමූහයක් උන් වහන්සේ පසු පස්සේ ගියහ. එවිට ජේසුස් වහන්සේ කන්දකට නැඟී තමන්ගේ ශ්‍රාවකයන් සමග එහි වැඩහුන් සේක. ජුදෙව්වරුන්ගේ මංගල්‍යය වූ පාස්කුව ළං ව තිබිණි. ජේසුස් වහන්සේ ඇස් ඔසවා බැලූ කල, තමන් ළගට මහා සමූහයක් ඇදී එනු දැක "මොවුන් හැම දෙනාට ම කන්නට දීමට අපි කොතැනින් පූප මිලේට ගනිමු දැ"යි පිලිප්ගෙන් ඇසූ සේක. උන් වහන්සේ මෙසේ වදාළේ ඔහු පරීක්‍ෂා කරන පිණිස ය. මන්ද තමන් කරන්නට යන්නේ කුමක් දැ යි උන් වහන්සේම දැන සිටි බැවිනි. පිලිප් පිළිතුරු දෙමින් "එකිනෙකාට ටික ටිකවත් දීමට රිදී කාසි දෙසීයක පූප වුවත් නොසෑහේ යැ"යි කීය. ශ්‍රාවකයන්ගෙන් එක් කෙනෙකු වූ සීමොන් පේදුරුගේ සොහොයුරු ඇන්ඩෘ උන් වහන්සේ අමතා "යව පූප පහක් ද මසුන් දෙදෙනෙකු ද ඇති කොලුවෙක් මෙහි සිටියි. එහෙත් මෙපමණ දෙනෙකුට එයින් කුමන පලක් දැ"යි ඇසීය. "මිනිසුන් හිඳුවන්නැ"යි ජේසුස් වහන්සේ වදාළ සේක. එතැන බොහෝ තණකොළ විය. ගණනින් පන්දහසක් පමණ පිරිමි එහි හිඳගත්හ. එවිට ජේසුස් වහන්සේ පූප ගෙන තුති පුදා හිඳගෙන සිටි අයට බෙදා දුන් සේක. එලෙසම මසුන් ද දුන් සේක. සියල්ලන්ට කැමැති තරම් කෑම ලැබුණේය. ඔවුන් කා තෘප්තියට පැමිණි පසු උන් වහන්සේ සිය ශ්‍රාවකයන් අමතා "කිසිවක් නාස්ති නොවන පිණිස කැබලි එකතු කර ගන්නැ" යි වදාළ සේක. මෙසේ කෑම වැළඳූ අය පූප පහෙන් ඉතිරි කළ කැබලි එකතු කොට මලු දොළොසක් පුරවා ගන්නා ලදි.

සමූහයා මේ හාස්කම දුටු කල "සැබැවින්ම මෙතුමාණෝ ලොවට වඩින්නට සිටින දිවැසිවරයාණෝ ය"යි කීහ. තමන් බලහත්කාරයෙන් අල්ලාගෙන රජකමට පත් කරන්නට ඔවුන් සැරසෙන බව ජේසුස් වහන්සේ දැනගෙන නැවත තනියම කන්දට වැඩිය සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.